රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/SD/08/01/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2013.12. 30

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 234/2013

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

<u>වින්ඩොස් පදනම් කරගත් නව වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය හඳුන්වාදීම</u>

රාජ්‍ය ආයතන වල වැටුප් සකස් කිරීම වෙනුවෙන් පවත්වාගෙන යන ඩොස් පදනම් වූ GPS පරිගණක වැඩසටහන වර්තමානයේ පවතින බොහෝ පරිගණක මගින් ක්‍රියාත්මක කිරීමේ ගැටළු පවතින බව වාර්තා වී ඇත.එසේ හෙයින් නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුරූපි වන ලෙස වැටුප් සකස් කිරීම සඳහා පරිගණක වැඩසටහනක් සකස් කරන තෙක් දැනට වැඩිදියුණු කල වින්ඩෝස් පදනම් කරගත් GPS වැඩසටහන මුදා හැරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. නව GPS වැඩසටහන ලබාගැනීම සඳහා ප්‍රධාන ගණකාධිකාරිවරයා හෝ වැටුප් සකස් කිරීම භාරව සිටින ගණකාධිකාරිවරයාගේ ලිඛිත ඉල්ලීමක් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කල යුතුය. ගණකාධිකාරිවරයෙක් නොමැති පළාත් පාලන ආයතන වෙනුවෙන් එවැනි ඉල්ලීමක් පළාත් පාලන හා පළාත්සභා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි/ගණකාධිකාරි හෝ අදාල පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) විසින් හෝ අදාල පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිවරයා විසින් සිදුකළ යුතුය .

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දී ඇති පරිගණක වැඩසටහන වෙනුවට වෙනත් පරිගණක වැඩසටහන් මගින් සමහර ආයතන විසින් වැටුප් සකස් කරන බව වාර්තා වී ඇත. එවැනි ක්‍රමවේදයන් අනුගමනය කල යුත්තේ දැනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති GPS පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කිරීම අපහසු විශේෂිත අවස්ථාවක පමණි. එවැනි වැඩසටහනක් ඔබ ආයතනයේ දැනට ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් එම ක්‍රමය මගින් මෙම චක්‍රලේඛයේ 07 වන ඡේදයේ සඳහන් චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව එම වැඩසටහන මගින් වැටුප් සකස් කරනු ලබන්නේද යන්න සඳහන් වාර්තාවක් මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

3. යම් අමාත්‍යාශයක්/දෙපාර්තමේන්තුවක්/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් හෝ ඊට අනුබද්ධිත උපකාර්යාලයක් පැරණි පරිගණක භාවිතා කරමින් තවදුරටත් ඩොස් පදනම් GPS වැඩසටහන භාවිතා කිරීම හෝ නව පරිගණක තුල නව වින්ඩොස් පදනම් කරගත් GPS වැඩසටහන භාවිතා කිරීමේ හැකියාව ඇත. ඒ සම්බන්ධයෙන් වූ තීරණය ගැනීමේ වගකීම වැටුප් ගෙවනු ලබන ආයතනය භාර ගණකාධිකාරිවරයා විසින් ඉටුකළ යුතුය.

මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733

4. නව GPS වැඩසටහන භාවිතා කරමින් වැටුප් සකස් කිරීමේදී එම ආයතන විසින් මාස තුනක උපරිම කාලයකට යටත්ව පැරණි පරිගණක භාවිතයෙන් ඩොස් පදනම් කර ගත් GPS වැඩසටහන මඟින්ද වැටුප් සකස් කිරීමට ක්‍රියාකල යුතුය.ඒ තුලින් බලාපොරොත්තු වන්නේ නව GPS වැඩසටහන භාවිතය, ගැටළු සහගත වන්නේ නම් ප්‍රමාදයකින් තොරව වැටුප් ගෙවීමේ කාර්ය ඉටුකිරීමත්, නව GPS වැඩසටහනේ විශ්වාසදායි බව සහ නිවැරදිබව ගණකාධිකාරීවරයාටම අවබෝධ කර ගැනීමට කාලය ලබාදීමත් වේ. මෙහිදී සමගාමීව වැඩසටහන් දෙක මඟින් වැටුප් සකස් කිරීම සිදුකලත් වැටුප් ගෙවීම සඳහා භාවිතා කල යුත්තේ එක් වැඩසටහනක ගෙවීම් දත්ත බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

5. වැටුප් සකස් කිරීම සඳහා භාවිතා කරන පරිගණක යන්ත්‍ර වලට අනුමැතියකින් තොරව ඇතුලත් වීමට ඇති අවකාශ අවුරා තැබීම සහ GPS වැඩසටහනේ පළමු රහස් අංකය ගණකාධිකාරීවරයා සතුවීමත් දෙවන සහ තෙවන රහස් අංක ප්‍රධාන ලිපිකරු හා විෂය ලිපිකරු වෙත ලබා දීමත් කල යුතුය. මෙම රහස් අංක අවම වශයෙන් මාස තුනකට වරක් වෙනස් කිරීම සුදුසු වේ.

6. අවසාන වැටුප් සකස් කිරීමේ ක්‍රියාවලිය (Payroll Process) ගණකාධිකාරීවරයා විසින් සිදුකල යුතුය. අදාල ගිණුම් සාරාංශය (Payroll Summary) මුද්‍රිත මඟින් ලබාගෙන ගෙවීමේ දි අත්සන් කරනු ලබන වාර්ථා සමඟ හෝ සසඳා බලා, වැටුප් ගෙවීමේ නිවැරැදිතාවය පිළිබඳ තහවුරු කරගත යුතුය.තවද පුද්ගල පඩිනඩි වෙනස් වීම් සහ වැය ලෙජරයට හර වන මුළු මුදල පසුගිය මාසයේ දත්ත සමඟ සංසන්ධනය කර නිවැරැදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතුය. එසේ නොකිරීම තුලින් මතුවන වංචනික ගෙවීම් වලදී වැටුප් ගෙවනු ලබන අංශය භාර ගණකාධිකාරීවරයාට වගකීමෙන් නිදහස් විය නොහැක.

7. වැටුප් සකස් කිරීමේ දි අනුගමනය කළ යුතු උපදෙස් ඇතුලත් පහත සඳහන් චක්‍රලේඛ වල සඳහන් කරුණු සම්බන්ධ අවධානය නැවතත් යොමු කරන මෙන් ද ඉල්ලමි.

- රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 225/2012 - 2012.10.22
- රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 211/2010 - 2010.10.11
- රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 171/2004 - 2004.05.11
- කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2010(4) - 2010.02.19

8. මේ පිළිබඳ විමසීමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් හෝ තව දුරටත් වැඩිදියුණු කළ යුතු අංශ වේ නම් ඒ සම්බන්ධයෙන් වන යෝජනා නොපමාව මෙම දෙපාර්තමේන්තුවේ, පද්ධති සංවර්ධන, පුහුණු හා අත්තිකාරම් ගිණුම් අංශයේ අධ්‍යක්ෂ බී.ඒ.ටී රුද්‍රිගු මහතා දු.ක. 011-2484735 , සහකාර අධ්‍යක්ෂ එස්.තර්ශන් මහතා දු.ක. 011-2484826 හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි ආර්. වටගොඩ මහතා දු.ක.011-2484881 දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට - විශ්වාසි

එන්.ජී.දයාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්